# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,879/5 — 1969 නොවැම්බර් 14 වැනි සිකුරාද — 1969.11.14**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අංක ඇම්ටී/8 දරණ ආහාර මිල නියෝගය** — **හරක් මස්**

**මිල පාලන පණත**

**නියෝගය**

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් නැනවතී අබේවික්‍රම වන මම, මෙම නියෝගය මඟින් පහත සඳහන් නියමයන් කරමි :—

(1) අංක 14,763/8 සහ 1967 අගෝස්තු මස 31 වැනි දින ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරණ ලද අංක ඇම්ටී/3/67 සහ 1967 අගෝස්තු මස 25 වැනි දින දරණ ආහාර මිළ නියෝගය මෙදැන් සිට අවලංගු කරමි.

(2) මෙහිවූ උප ලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් මිළ, ඒ තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් ඒ උප ලේඛනයේ 1 වැනි තීරයෙහි වූ අනුරූප සටහනෙහි සඳහන් ප්‍රදේශ තුළ විකිණිය යුතු උපරිම මිළ ලෙස වහාම ක්‍රියාත්මක කළ යුතුයි;

(3) මෙම නියෝගයේ කාර්යය සඳහා :—

(අ) '' හරක් මස් '' යන පාඨයට එළ හරක් හා මී හරක් මාංශ ඇතුලත්වන අතරම මාංශාවශේෂ කිසිවක් ඇතුලත් නොවේ ;

(ආ) සතෙකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවේදී පිළියෙළ කොට ඇති අයුරින් (එනම්, හිස, හම, බඩවැල්, මාංශාවශේෂ, කුර සහ සාමාන්‍යයෙන් ඉවත්කරනු ලබන කොටස් හැර) විකුණන විට එය '' තනි බර '' අනුව කෙරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුයි;

(4) කටු සහිත හරක් මස් විකිණීමේදී මේ සමඟ විකුණු කටුවල බර විකුණු මුළු බරින් සියයට 25 කට වැඩි නොවිය යුතුයි ;

(5) මෙහිවූ උප ලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශ ඇතුලතවූ යම් ස්ථානයක ඒ උප ලේඛනයේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ හරක් මස් සම්බන්ධයෙන් මේ නියෝගයෙන් නියමිත උපරිම මිළ සඳහන් කළ දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශණය කළ යුතුයි ;

(6) හරක් මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශණය කළ යුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳ පිල්වල පමණක්වූ අතර එම වෙළඳ පිල්වල වෙනයම් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම හෝ නොකළ යුතුයි ;

(7) මෙහිවූ උප ලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශ ඇතුලතවූ යම් ස්ථානයක ඒ උප ලේඛනයෙහි සඳහන් වර්ගයට හෝ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳ පිලෙහි එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක් මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙනෙන ලෙස දැන්වීමක් ප්‍රදර්ශණය කළ යුතුයි;

(8) එක් ගණුදෙනුවක් කිරීමේදී කටු රහිත හරක් මස් හෝ කටු සහිත හරක් මස් හෝ සමඟ මාංශාවශේෂ විකුණනු ලබන විට කටු රහිත හරක් මස් හෝ කටු සහිත හරක් මස් හෝ මාංශාවශේෂ වලින් වෙන්කොට කිරා විකිණිය යුතුයි;

(9) හරක් මස් විකුණනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම, යම් කෙනෙකු විසින් හරක් මස් ඉල්ලූවිට මාංශාවශේෂයෙන් තොර හරක් මස් පමණක් විකිණිය යුතුයි;

(10) සෑම වෙළෙන්දෙකුම හරක් මස් විකුණන කල්හි, හරක් මස් ගැණුම්කරු විසින් මිළයට ගන්නා හරක් මස් ප්‍රමාණයෙහි සැබෑ බර පහසුවෙන් බලාගැණීමට හැකිවන සේ තම තරාදිය හෝ තරාදි හෝ තැබිය යුතුයි ;

(11) මෙහි වූ උප ලේඛනයෙහි සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක් මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, හරක් මස් ගැණුම්කරු විසින් ඉල්ලා සිටි විට පහත සඳහන් කරුණු දැක්වෙන කුවිතාන්සියක් ඔහුට දිය යුතුයි :—

(අ) විකුණූ දිනය
(ආ) විකුණූ හරක් මස් ප්‍රමාණය (බර අනුව)
(ඇ) විකුණූ හරක් මස් වර්ගය හා
(ඈ) විකුණූ හරක් මස් ප්‍රමාණයට ගෙවූ මිළ;

(12) මෙම නියෝගයෙන් උපරිම මිළ නියමකරන ලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවෙකු විසින් උප ලේඛනයේ සඳහන් භාණ්ඩය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමඟ කළවම් කොට හෝ නොවිකිණිය යුතුයි ;

(13) උප ලේඛනයෙහි සඳහන් භාණ්ඩය විකුණන කල්හි ඒ භාණ්ඩය ඔතා හෝ බහා හෝ දෙන කිසියම් ද්‍රව්‍යයක් වුවහොත් එහි මිළද එම උප ලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත්විය යුතුයි ;

(14) මෙම නියෝගයේ කාර්යය සඳහා '' රාත්තල '' හෙවත් ''රා. '' යන්න ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතුයි.

1969 නොවැම්බර් මස 4 වැනි දින පෙ.ව. 11.00 ට මාතර කච්චේරියේදී අත්සන්කරණ ලදී.

ඇන්. අබේවික්‍රම,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

**හරක් මස් සඳහා උපරිම මිළ**

| 1 වැනි තීරය<br>ප්‍රදේශ | | 2 වැනි තීරය<br>හරක් මස් කටු රහිත රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | | 3 වැනි තීරය<br>හරක් මස් කටු සහිත රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | | 4 වැනි තීරය<br>හරක් මස් තනි බර අනුව රාත්තලක උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|---|---|---|
| දික්වැල්ල ගම් සහා ප්‍රදේශය- හැර මාතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රදේශ තුළ | ... | 1 10 | ... | 1 0 | ... | 0 92 |
| දික්වැල්ල ගමසහා ප්‍රදේශය තුළ | ... | 1 0 | ... | 0 90 | ... | 0 82 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා එම් ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. එයින් වැඩි මිළකට විකිණීම නොකළ යුතුයි.

11—108/1

---

**අංක ඇම්ටී/9 දරන ආහාර මිළ නියෝගය** **එළු මස්**

## මිළ පාලන පණත

**නියෝගය**

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් නැනවතී අබේවික්‍රම වන මම, පහත සඳහන් නියමයන් කරමි :—

(1) අංක 14,763/8 සහ 1967 අගෝස්තු මස 31 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක ඇම්ටී/3/67 සහ 1967 අගෝස්තු මස 25 වැනි දින දරණ ආහාර මිළ නියෝගය මෙතැන් සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් මිළ, එළු මස් රාත්තලක වැඩිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළු මස් එම උපලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් කොට ඇති ප්‍රදේශ තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා :—

(අ) '' එළු මස් '' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවකුගේ හෝ එළුවෙකුගේ මාංශයයි. බොකු බඩවැල් ආදී සියළු ආකාර ඉවත් කරනු ලබන දය මීට ඇතුළත් නොවේ ;

(ආ) බැටළුවකුගේ හෝ එළුවෙකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිළියෙල කොට ඇති පරිදි (එනම් : හිස, හම, බොකු, බඩවැල් කුර සහ වෙනත් සියළු විදියේ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන දය අතහැර) විකුණන විට '' තනි බර '' අනුව විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) කටු සහිත එළු මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25 කට වඩා කටු වල බර වැඩි නොවිය යුතුයි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ, උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළු මස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළු මස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ හෝ පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුය.

(6) ඉවත් කරනු ලබන දය සමග එළු මස් එකම ගනුදෙනුවකදී විකුණන ලබන විට එළු මස්, ඉවත් කරනු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(7) සෑම වෙළෙන්දෙකුම එළු මස් විකුණන කල්හි, එළු මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකි වන සේ බර කිරණ තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(8) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළු මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළු මස් ලබා ගන්නෙකු ඉල්ලා සිටින විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ එළු මස් ප්‍රමාණය (බර අනුව);
(ඇ) විකුණූ එළු මස්වල විස්තරය ;
(ඈ) විකුණූ එළු මස් ප්‍රමාණයට ගෙවූ මුදල සඳහන් විය යුතුයි.

(9) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ කිසිවෙකු විසින් උපලේඛනයේ සඳහන් දය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතුයි.

(10) උපලේඛනයෙහි සඳහන් දය විකුණන කල්හි, එකී දය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය උපලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(11) මෙම නියෝගයේ කාර්යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1969 නොවැම්බර් මස 4 වැනි දින, පෙරවරු 11.00 ට මාතර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇන්. අබේවික්‍රම,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

**එළු මස් සඳහා උපරිම මිළ**

| 1 වැනි තීරය<br>ප්‍රදේශ | | 2 වැනි තීරය<br>එළු මස් කටු රහිත රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | | 3 වැනි තීරය<br>එළු මස් කටු සහිත රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | | 4 වැනි තීරය<br>එළු මස් තනි බර අනුව රාත්තලක උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|---|---|---|
| මාතර නගර සහා ප්‍රදේශය හැර මාතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රදේශ තුළ | ... | 2 50 | ... | 2 25 | ... | 2 0 |
| මාතර නගර සහා ප්‍රදේශය තුළ ... ... ... | ... | 2 75 | ... | 2 40 | ... | 2 10 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11—108/2

---

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.